# මිල වැටුප් හා සේවා නියුක්තිය

## සමස්ත මිල වෙනස්වීම්

1990 වසරේදී සාමාන්‍ය මිල මට්ටමේ තියුණු ඉහළ යාමක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 11.6 ක වර්ධනය හා සසඳන කල, 1990 දී කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 21.5 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. 1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා කාලය තුළ දර්ශකයේ වර්ධනය සියයට 19.6 ක් වූ අතර, එය සාමාන්‍ය වාර්ෂික වර්ධනයට වඩා මදක් අඩුවිය. මිල ඉහළ යාමේ උපනතිය ප්‍රාථමික වෙළඳපොලේ ද පැවති බව දක්වමින් 1990 දී තොග අලෙවි මිල දර්ශකය සියයට 22.2 ක වාර්ෂික සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළේය. 1989 වසරේදී මෙම වැඩිවීම සියයට 9.0 ක් පමණක් විය.

මිල පාලනය කරන භාණ්ඩ මිලෙහි තබන ලද නිවැරදි ගැලපුම් වසරේ මුල් හය මාසයේ මිල මට්ටමෙහි තියුණු ඉහළ යාමට බලපෑ හේතුවක් විය. අවුරුද්දේ මුල් මාස කීපය තුළ පොහොර මිල සැළකිය යුතු ඉහළ දැමීමකට ලක්වුණු අතර, වී වල සහතික මිල ද ප්‍රතිශෝධනයකට ලක් විය. යල කන්නයේ ඉතාමත් සතුටුදායක වූ අස්වැන්න, වසරේ තුන්වැනි කාර්තුවේ මිල මධ්‍යස්ථ භාවයට හේතු වුවත්, ඉන්ධන මිල ප්‍රතිශෝධනයේ සෘජු හා වක්‍රීය බලපෑම් වසරේ අවසාන මාස වල මිල වර්ධනයෙහි ලා හේතු විය. විදුලි ගාස්තු හා තැපැල් ගාස්තු 1990 දී වැඩි කරන ලදී.

ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයන් මැඩලීම සඳහා 1989 මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ, ණය සීමාවන් පැනවීම වැනි මූල්‍ය ප්‍රතිපත්තීන් 1990 දී තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. 1990 ජූලි මාසයේදී බැංකු අනුපාතය නැවත වරක් ප්‍රතිශෝධනය කෙරිණි. කෙසේවෙතත්, මේ ප්‍රතිපත්තීන් අනුගමනය කළ ද, වර්ෂය තුළදී මූල්‍ය සමස්තයන් ප්‍රසාරණය වීම හේතුකොට ගෙන, සමස්ත ඉල්ලුම ඉහළ යාමේ හේතුවෙන් මිල මට්ටම් මත අමතර පීඩනයක් ඇති කිරීම සිදුවී ඇත.

### පාරිභෝගික මිල

1980 සිට වාර්තා වූ ඉහළම වර්ධනය පෙන්නුම් කරමින් 1990 දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය සියයට 21.5 ක සාමාන්‍ය වර්ධනයක් දක්වයි. මෙම මුළු වැඩිවීමෙන් සියයට 74.4 ක ප්‍රමාණයක වගකීමක් දරන්නේ වර්ෂය තුළදී ආහාර මිල ගණන් ඉහළ යාමයි. රෙදිපිළි, ඉන්ධන හා ආලෝකය සහ විවිධ භාණ්ඩයන් පිළිවෙලින් සියයට 6.3, 5.1 ක හා 14.1 ක ප්‍රමාණයන්ගෙන් මෙම මුළු වැඩිවීමට දායක වී ඇත.

1990 මුල් භාගය මිල මට්ටමෙහි තියුණු ඉහළ යාමක් සලකුණු කෙරිණ. 1990 ජූලි සිට ඔක්තෝබර් දක්වා මිල ඉහළ යාමේ මන්දගාමී බවක් පෙන්නුම් කළ ද, නැවතත් අවුරුද්දේ අවසාන මාස දෙකේ මිලෙහි සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබුණි.

1989 වසරේ සියයට 10.3 ක වැඩිවීම හා සසඳන කල 1990 දී ආහාර උපදර්ශකය (බර =61.9%) සියයට 23.3 ක වාර්ෂික සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරයි. 1989 අවසාන භාගයේදී ප්‍රතිශෝධනය කරන ලද පාන් හා තිරිඟු පිටි මිල 1990 මුල් භාගයේදී තවදුරටත් ප්‍රතිශෝධනයකට ලක් කෙරිණ. ඒ හේතුකොට, සතුටුදායක වී නිෂ්පාදනයක් තිබියදීත් වසර තුළ හාල් මිල ද ඉහළ මට්ටමක පැවතුණි. තිරිඟු පිටි මිලෙහි ආදේශන ප්‍රතිඵලය හා පොහොර මිල වැඩිවීමෙන් නිෂ්පාදන වියදම් වැඩිවීමද මෙයට හේතු විය. වසර තුළදී මාළු, හරක්මස්, එළවලු, අර්තාපල් සහ රතුළූණු වැනි ප්‍රධාන ආහාර වර්ග වලද සැළකිය යුතු මිල ඉහළ යාමක් වාර්තා වී ඇත. යල කන්නයේ වියළි මිරිස්, එළවළු සහ අර්තාපල් වැනි කෘෂි භාණ්ඩයන්හි මධ්‍යස්ථ මිල ගණන්, වසරේ ජූලි, ඔක්තෝබර් කාලය තුළ මිල වැඩිවීම සමනය කිරීමට විශාල වශයෙන් හේතු වී ඇත. එහෙත්, සෘතුමය සාධක හා ඉන්ධන මිල ඉහළ යාමත් හේතුකොට නොවැම්බර් දෙසැම්බර් මාස තුළ ආහාර මිල තියුණු ලෙස ඉහළයාම නිසා, මෙම මිල අඩු වීමේ ප්‍රවනතාව ඒ ලෙසින්ම නොපැවතුනි.

**1 . 33 සංඛ්‍යා සටහන**

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**

**(1952 = 100)**

| | සාමාන්‍ය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1988 ට වඩා 1989 | 1989 ට වඩා 1990 | 1988 දෙසැම්බර් වලට වඩා 1989 දෙසැම්බර් වල වෙනසෙහි ප්‍රතිශතය | 1989 දෙසැම්බර් වලට වඩා 1990 දෙසැම්බර් වල වෙනසෙහි ප්‍රතිශතය |
| සියළුම ශීර්ෂ .. | 830·2 | 1,008·6 | 11·6 | 21·5 | 15·1 | 19·6 |
| ආහාර .. | 884·6 | 1,090·9 | 10·3 | 23·3 | 13·5 | 20·8 |
| රෙදිපිළි .. | 490·0 | 610·2 | 16·7 | 24·5 | 32·8 | 12·7 |
| ඉන්ධන සහ ආලෝකය .. | 1,718·9 | 1,934·1 | 12·0 | 12·5 | 11·1 | 22·8 |
| ගෙවල් කුලී .. | 109·8 | 109·8 | — | — | — | — |
| විවිධ .. | 860·2 | 1,021·0 | 15·8 | 18·7 | 19·7 | 16·6 |

මූලයන් : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

1989 වසරේ සියයට 16.7 ක වැඩිවීම හා සසඳන විට 1990 දී රෙදිපිළි උප දර්ශකය සියයට 24.5 ක වාර්ෂික සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් 1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා වූ වර්ධනය සලකන කල එය සියයට 12.7 ක් පමණි.

1990 වසරේ ඉන්ධන හා ආලෝකය උප දර්ශකය සියයට 12.5 කින් ඉහළ ගොස් ඇති අතර, එය 1989 වසරේ එම වැඩිවීම වන සියයට 12.0 හා සැසඳේ. 1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා උප දර්ශකය සියයට 22.8 ක වැඩිවීමක් වාර්තා කළ අතර, ගල්ෆ් අර්බුදය හේතුවෙන් භූමිතෙල් මිළෙහි සිදු කරන ලද ප්‍රතිශෝධනයන් විශාල වශයෙන් මෙයට හේතු විය. (භූමිතෙල් මිළ 1983 සිට නොවෙනස්ව පැවතුණි). වසර තුළ දර මිළ ද ඉහළ ගොස් ඇත. විවිධ භාණ්ඩ සඳහා වන උප දර්ශකයේ සාමාන්‍ය වාර්ෂික වැඩිවීම සියයට 18.7 ක් වූ අතර, පසුගිය වසරේ මෙම වැඩිවීම සියයට 15.8 ක් විය. ප්‍රවාහණ ගාස්තු, තැපැල් ගාස්තු සහ මත්පැන් හා සිගරට් මිළෙහි සිදු කරන ලද ප්‍රතිශෝධනයන්ද මෙම වැඩිවීමට හේතු වී ඇත.


**තොග මිළ**

1989 අවසාන මාස කීපය තුළ ප්‍රාථමික වෙළෙඳපොල මට්ටමේ ඇති වූ මිළ වැඩිවීමේ ප්‍රවනතාව 1990 වසරේ ද ඉදිරියට යමින් තොග මිළ දර්ශකය සියයට 22.2 ක වාර්ෂික සාමාන්‍ය වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. පසුගිය වසරේ තොග මිළ දර්ශකයේ වැඩිවීම සියයට 9.0 ක් පමණක් විය. කෙසේවෙතත් 1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා කාලය සලකා බලන විට තොග මිළ දර්ශකය සියයට 17.0 ක සාපේක්ෂව අඩු වර්ධන වේගයක් පෙන්නුම් කෙරුණි.

# තොග අලෙවි මිළ දර්ශකය

1974 = 100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

වසර තුළ තොග මිළ දර්ශකයේ වැඩිවීමට ඉහළ ආහාර මිළ ගණන් බොහෝදුරට බලපා ඇත. වී, වියළි මිරිස් සහ එළවළු වැනි භාණ්ඩයන්හි තියුණු මිළ ඉහළ යාමක් දක්නට ලැබුණි. දර්ශකය තුල තේ නිර්යාත මිලෙහි අධිබර නිසා තේ නිර්යාත මිළ වැඩිවීම දර්ශකයේ ඉහළ යාමට සැහෙන හේතුවක් විය. භාණ්ඩ කාණ්ඩ අතර රසායන නිෂ්පාදන සහ ලෝහ නොවන නිෂ්පාදනයන්හි තියුණු මිළ නැග්මක් වාර්තා කෙරුණි. මෙම වැඩිවීම් වලට ප්‍රධාන හේතූන් වූයේ පිළිවෙලින් පොහොර මිළ වැඩිවීම හා ගොඩනැගිලි ද්‍රව්‍ය මිළ වැඩිවීමයි. ඉන්ධන මිළ වැඩිවීමට අනුරූපව ඛනිජ තෙල් නිෂ්පාදන උප දර්ශකය සියයට 23.1 කින් වැඩි වී ඇත. අනෙකුත් සියළුම භාණ්ඩ අනුව උප දර්ශකයන්හි වසර තුළ සැළකිය යුතු වර්ධනයක් වාර්තා කෙරුණි.

ආංශික වර්ගීකරණයේදී දේශීය කාණ්ඩයේ උප දර්ශකය සියයට 26.7 ක වර්ධනයක් පෙන්නුම් කරයි. එය 1989 වසරේ සියයට 21.6 ක වර්ධනය හා සැසඳේ. ආයාතයන් සඳහා වන උප දර්ශකයේ වසර තුළදී සියයට 26.2 ක වර්ධනයක් දක්නට ලැබුණි. 1989 වසරේදී මෙම වැඩිවීම සියයට 13.7 කි. පසුගිය වසරේ පහත වැටුණු නිර්යාත මිළ 1990 දී සියයට 13.2 කින් වැඩි වී ඇත.

**1.34 සංඛ්‍යා සටහන**

**තොග අලෙවි මිළ දර්ශකය – 1990**
**(1974 = 100)**

| ශීර්ෂය | සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | 1988 දෙසැම්බර් වලට වඩා 1989 දෙසැම්බර් වල වෙනසෙහි ප්‍රතිශතය | 1989 දෙසැම්බර් වලට වඩා 1990 දෙසැම්බර් වල වෙනසෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1988 ට වඩා 1989 | 1989 ට වඩා 1990 | | |
| සියළුම ශීර්ෂ .. | 532·9 | 651·1 | 9·0 | 22·2 | 18·3 | 17·0 |
| ආහාර .. | 493·3 | 599·1 | 4·5 | 21·4 | 16·1 | 14·7 |
| මද්‍යපාන .. | 573·0 | 668·9 | 13·9 | 16·7 | 22·0 | 11·1 |
| රෙදිපිළි හා පාවහන් .. | 343·6 | 404·7 | 4·3 | 17·8 | 6·0 | 18·8 |
| කඩදාසි නිෂ්පාදන .. | 550·1 | 722·4 | 21·6 | 31·3 | 16·2 | 30·4 |
| රසායන හා රසායනික නිෂ්පාදන .. | 291·9 | 423·8 | 12·5 | 45·2 | 6·7 | 40·0 |
| ඛනිජ තෙල් නිෂ්පාදන .. | 762·3 | 938·4 | 11·3 | 23·1 | 22·8 | 31·3 |
| ලෝහ නොවන නිෂ්පාදන .. | 735·9 | 1,131·4 | 11·8 | 53·7 | 12·8 | 53·6 |
| ලෝහ නිෂ්පාදන .. | 469·6 | 568·6 | 31·0 | 21·1 | 43·9 | – 0·7 |
| ප්‍රවාහන උපකරණ .. | 395·9 | 505·4 | 23·2 | 27·7 | 17·2 | 24·7 |
| විදුලි උපකරණ හා සැපයීම් .. | 427·8 | 532·7 | 23·6 | 24·5 | 37·2 | 4·8 |
| යන්ත්‍රෝපකරණ .. | 285·7 | 375·1 | 8·1 | 31·3 | 3·1 | 34·6 |
| ඉන්ධන හා ආලෝකය .. | 1,002·9 | 1,233·6 | 33·0 | 23·0 | 22·4 | 16·4 |
| විවිධ .. | 1,051·2 | 1,167·6 | 27·1 | 11·0 | 36·2 | 4·2 |
| අංශික වර්ගීකරණය I .. | | | | | | |
| දේශීය ගණය .. | 466·0 | 590·3 | 21·6 | 26·7 | 23·6 | 22·5 |
| ආනයන ගණය .. | 458·7 | 578·8 | 13·7 | 26·2 | 23·7 | 16·5 |
| අපනයන ගණය .. | 772·1 | 874·2 | – 6·6 | – 13·2 | 8·5 | 9·8 |
| ආංශික වර්ගීකරණය II .. | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ .. | 519·5 | 631·3 | 6·1 | 21·5 | 16·1 | 15·7 |
| අන්තර් භාණ්ඩ .. | 588·4 | 714·1 | 18·8 | 21·4 | 26·8 | 18·6 |
| ආයෝජන භාණ්ඩ .. | 503·6 | 700·3 | 14·6 | 39·1 | 17·2 | 33·9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

අවසන් භාවිතාව අනුව පාරිභෝගික භාණ්ඩ මිළ සියයට 21.5 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. එය 1989 වසරේ සියයට 6.1 ක වර්ධනය හා සැසඳේ. අන්තර් භාණ්ඩ මිළ සියයට 21.4 කින් වැඩි වී ඇත. 1989 දී එම වර්ධනය සියයට 18.8 කි. 1989 වසරේ සියයට 14.6 ක වර්ධනය හා සසඳන විට 1990 දී ආයෝජන භාණ්ඩ මිළ සියයට 39.1ක ඉතාමත් තියුණු වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන භාණ්ඩ උප දර්ශකය වැඩිවීමෙහි ලා, ගොඩනැගිලි ද්‍රව්‍ය වල ඉහළ මිළ ගණන් විශාල ලෙස දායක වී ඇත.

## වැටුප්

1990 වර්ෂය තුළදී රාජ්‍ය අංශයෙහි සහ සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි සමස්ත මූල්‍ය වැටුප් පසුගිය අවුරුද්දට වඩා තියුණු ලෙස වැඩිවිය. මූල්‍ය වැටුප් මට්ටම සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගිය ද, මිළ මට්ටම ද වේගයෙන් ඉහළ යාම නිසා සෑම කාණ්ඩයකම පාහේ මූර්ත වැටුප් මට්ටම්වල පිරිහීමක් දක්නට ලැබුණි.

### සංවිධානය වූ අංශය

සියළුම රාජ්‍ය සේවකයින්ගේ මූල්‍ය වැටුප්, මූල්‍ය වැටුප් දර්ශකය මගින් දක්වුන ආකාරයට සියයට 13.0 ක තියුණු වර්ධනයක් පෙන්වන අතර, පසුගිය වසරේ එම වැඩිවීම සියයට 8.2 ක් විය. රාජ්‍ය අංශයෙහි මධ්‍යම සහ පහළ වැටුප් ලබන්නන්ට උද්ධමනයට හිලවු කිරීමක් වශයෙන් දෙන ලද විශේෂ දීමනා දෙක මෙයට හේතු විය. ආරම්භක ඒකාබද්ධ වැටුප් තලය රුපියල් 2000/- හෝ ඊට අඩු වැටුප් ලබන සේවකයින්ට රුපියල් 200/-ක විශේෂ දීමනාවක් 1990 ජනවාරි මස සිට ගෙවන ලදී. එමෙන්ම, තවදුරටත් එම අවුරුද්දේම නොවැම්බර් මාසයේ සිට ආරම්භක ඒකාබද්ධ වැටුප් තලය රුපියල් 2,000/- හෝ ඊට අඩු හෝ රුපියල් 2,001/- ත්, 3,000/- ත් අතර වැටුප් ලබන සියල්ලන්ටම පිළිවෙලින් රුපියල් 300 ක හා 200 ක අමතර දීමනාවක් ගෙවන ලදී. කෙසේවුවද, මෙම දීමනාවන් දී තිබුණ ද සමස්ත රාජ්‍ය අංශයෙහි මූර්ත වැටුප් මට්ටම් වර්ෂය තුළදී සියයට 7.1 කින් පහත වැටුණි. 1989 දී රාජ්‍ය අංශයෙහි මූර්ත වැටුප් (මට්ටම්හි) පහත වැටීම සියයට 2.8 ක් විය.


විධායක නොවන නිලධාරීන්ගේ සහ සුළු සේවකයින්ගේ මූල්‍ය වැටුප් වැඩිවීම 1990 දී පිළිවෙලින් සියයට 11.0 ක් සහ සියයට 15.5 ක් වූ අතර, පසුගිය වසරේ පිළිවෙලින් සියයට 8.8 ක් සහ සියයට 7.4 ක් විය. පසුගිය වසරේ මෙන්ම, මෙම කාණ්ඩයන් දෙක සඳහාම මූර්ත වැටුප් මට්ටම්හි පිරිහීමක් මෙම වසරේ ද වාර්තා විය. පසුගිය අවුරුද්ද හා සසඳන කළ රජයේ පාසැල් ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප් හි වර්ධනය 1990 දී සුළු වශයෙන් පහත වැටුණි. මෙම කාණ්ඩය සඳහා සියයට 10.0 ක වැඩිවීමක් 1990 දී වාර්තා වූ අතර, අදාල සංඛ්‍යාව 1989 වර්ෂය සඳහා සියයට 10.9 ක් විය.

පඩිපාලක සභාව මගින් ආවරණය වන, සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි මූල්‍ය වැටුප් හි 1989 දී වාර්තා කළ සියයට 15.6 හා සසඳා බලන විට 1990 දී සියයට 16.9 කින් ඉහළ ගියේය. පසුගිය වසරේ වූ මූර්ත වැටුප් මට්ටම්හි ඉහළ යාමට ප්‍රතිවිරුද්ධව, 1990 දී මූර්ත වැටුප් සියයට 3.9 කින් පහළ යාමක් වාර්තා විය. කෘෂිකර්මකරුවන්ගේ 1989 දී වාර්තා කළ සියයට 15.2 ක මූල්‍ය වැටුප් වර්ධනය හා සසඳා බලන විට 1990 දී වර්ධනය සියයට 18.7 ක් විය. මෙම කම්කරු කාණ්ඩයේ මූර්ත වැටුප් සියයට 2.4 කින් පිරිහිණ. කාර්මික හා වාණිජ කම්කරුවන්ගේ සියයට 13.3 ක මූල්‍ය වැටුප් වැඩිවීම, 1989 වර්ෂයේ මෙම අංශයෙහි ඉහළ වැටුප් වැඩිවීමට (සියයට 23.3) වඩා සැහෙන පහත වැටීමක් විය. පසුගිය වර්ෂයේ වර්ධනය වූ ඔවුන්ගේ මූර්ත වැටුප්, විමර්ශනය කරන වර්ෂය තුළදී පහත වැටුණි. පසුගිය වසරේ මෙන්ම සේවා අංශයේ කම්කරුවන්ගේ වැටුප් වර්ධනය අනෙකුත් කාණ්ඩයන්ට වඩා තරමක් පහත මට්ටමක විය. මෙම අංශයෙහි මූල්‍ය වැටුප් වැඩිවීම 1989 දී සියයට 7.1 ක් වූ අතර, 1990 දී එහි වර්ධනය සියයට 8.9 ක් පමණ විය.

## වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 35 සංඛ්‍යා සටහන

### වැටුප් ප්‍රමාණ දර්ශක අංක (1978 දෙසැම්බර් = 100)

| | 1989 | | 1990 | | 1989 ට වඩා 1990 වෙනසෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| **1. රජයේ සේවකයන්** | | | | | | |
| සියළුම විධායක නොවන නිලධාරීන් | 396·0 | 114·4 | 439·6 | 104·3 | 11·0 | - 8·8 |
| සුළු සේවකයන් | 444·6 | 128·4 | 513·5 | 121·8 | 15·5 | - 5·1 |
| සියළුම රජයේ සේවකයන් | 421·8 | 121·9 | 476·8 | 113·2 | 13·0 | - 7·1 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 367·8 | 106·3 | 404·5 | 96·0 | 10·0 | - 9·7 |
| **2. පඩි පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන්** | | | | | | |
| කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන් | 435·9 | 125·7 | 517·2 | 122·7 | 18·7 | - 2·4 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන් | 334·9 | 96·6 | 579·5 | 89·9 | 13·3 | - 6·9 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 245·9 | 71·0 | 267·8 | 63·5 | 8·9 | - 10·6 |
| පඩි පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් | 388·1 | 112·0 | 453·5 | 107·6 | 16·9 | - 3·9 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

පඩිපාලක සභාව මගින් ආවරණික කර්මාන්ත කිහිපයකම සේවකයින්ගේ වැටුප් මෙම වසර තුළදී රුපියල් 200/- කින් වැඩිවිය. බතික්, ගිනිපෙට්ටි, සිනමා, ගඩොල් සහ උළු, වී කෙටීම, වීදුරු සහ බේකරි යන කර්මාන්තයන්හි නියැලි සේවකයින්ගේ ද අවම වැටුප් මට්ටම් ද 1990 වර්ෂය තුළදී වැඩි කරන ලදී.

## සේවා නියුක්තිය

තාවකාලික ඇස්තමේන්තු වලට අනුව පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිය 1990 වසරේදී වර්ධනය වී ඇත. ඊට ප්‍රතිවිරුද්ධව රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය සුළු වශයෙන් අඩු වී ඇත. රාජ්‍ය අංශය තුළ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය.

රාජ්‍ය අංශයෙහි එනම්, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය ඇස්තමේන්තු කිරීමට පදනම් වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයෙන් එකතු කරන ලද දත්තයන්ය. තවද, රාජ්‍ය අනු අංශයෙහි (රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) සේවා නියුක්තිය පිළිබඳ දත්ත මහා භාණ්ඩාගාරයේ වාර්ෂික සේවා නියුක්ති ඇස්තමේන්තු සමඟ ද ගලපන ලදී. තාව-කාලික ඇස්තමේන්තු වලට අනුව 1990 වසර අවසානයේ රාජ්‍ය අංශයෙහි මුළු සේවක සංඛ්‍යාව 1,318,150 ක් වූ අතර, මෙය සියයට 1.5 ක අඩුවීමකි. රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය සභා හා පළාත්පාලන සභා යනාදියෙන් සමන්විත වන රජයේ ආයතන වල සේවා නියුක්තිය 1990 වසර අවසාන වනවිට 609,750 ක් වූ අතර, එය සියයට 3.6 ක වර්ධනයකි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආරක්ෂක සේවාවන්හි නියුතු අය ඇතුලත් වන සේවාවන්හි නියුක්ත වූ සේවක කාණ්ඩයෙහි වර්ධනයයි. අනෙකුත් සේවක කාණ්ඩයන්හි සේවා නියුක්තිය, 1989 පැවති මට්ටමේම හෝ ඊට අඩුව පැවතිනි. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අංශයෙහි බැංකු වලින් සමන්විත වන අර්ධ රාජ්‍ය ආයතන වල සේවා නියුක්තිය 1990 වසර අවසානයේදී 708,400 ක් වූ අතර, එය ඉකුත් වර්ෂය හා සසඳන කල සියයට 5.5 ක අඩුවීමකි.

රැකියා වර්ගීකරණයට අනුව සකස් කරන ලද සේවා නියුක්ති සංඛ්‍යා වලින් පෙනී යන්නේ රාජ්‍ය අංශයෙහි මුළු සේවක සංඛ්‍යාවෙන් 529,850 ක් වූ වැඩිම පිරිසක් එනම් සියයට 40.2 ක් බරවැඩ කම්කරුවන් වූ බවය. කෙසේ වුවත් 1989 වර්ෂය හා සසඳන කල 1990 දී මෙම රැකියා කාණ්ඩයට අයත් සේවකයන් සියයට 2.2 කින් අඩුවී ඇත. බරවැඩ කම්කරුවන්ගෙන් ඉතා විශාල අනුපාතයක් වන, වතු කම්කරුවන්ගේ සංඛ්‍යාව 1989 වසර අවසානයේදී 400,500 ක් වූ අතර, එය 1990 වසර අවසානයේදී 394,100 දක්වා අඩු විය. මෙය සියයට 1.6 ක අඩුවීමකි.

වෘත්තීය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවක සංඛ්‍යාව 249,500 ක් වූ අතර, එය 1990 වසරේ රාජ්‍ය අංශයෙහි දෙවැනි විශාලම රැකියා කාණ්ඩය විය. මෙය රාජ්‍ය අංශයෙහි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 19 කි. රාජ්‍ය අනු අංශයෙහි මෙම රැකියා කාණ්ඩයට අයත් සේවකයන්-ගෙන් සියයට 70 කට ආසන්න සංඛ්‍යාවක් පාසැල් ගුරුවරු වෙති. රාජ්‍ය අංශයෙහි තෙවැනි විශාලම රැකියා කාණ්ඩය වන ලිපිකාර හා ඊට සම්බන්ධ සේවක සංඛ්‍යාව 220,700 ක් විය.

සේවාවන්හි නියුක්ත සේවක සංඛ්‍යාව 1990 අවසාන වනවිට 198,300 ක් වූ අතර, එය රාජ්‍ය අංශයෙහි වැඩිම සේවක වර්ධනයක් (සියයට 20 ක් පමණ) පෙන්නුම් කළ රැකියා කාණ්ඩය විය.

රාජ්‍ය අංශයෙහි සේවකයන්ගෙන් සියයට 78.7 ක් පිරිමි වූහ. ආරක්ෂක අංශයෙහි සේවකයන් අතහැර ගත්කල, රජයේ ආයතනවල සේවකයන්ගෙන් සියයට 71.5 ක් පිරිමි වෙති. අර්ධ රාජ්‍ය ආයතනවලද සේවා නියුක්තියෙහි වැඩි අනුපාතයක්, එනම් සියයට 85.5 ක් පිරිමි සේවකයන් විය. ස්ත්‍රීන් වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටියේ ලිපිකාර හා ඊට සම්බන්ධ සේවාවන්හි හා වෘත්තීය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවකයින් යන රැකියා කාණ්ඩ වලය.

පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික දත්ත නොමැති බැවින් එම අංශයෙහි සේවා නියුක්තිය තක්සේරු කිරීමට වෙනත් දර්ශක යොද ගැනුණි. 1989 වර්ෂය අවසානයේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාව 4,665,134 දක්වා සියයට 4.3 කින් වැඩිවිය. මෙහි ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව අදාල කාලපරිච්ඡේදය තුළ 1,175,444 සිට 1,188,757 දක්වා සියයට 1.1 කින් වැඩිවිය. අනුමත කළ අර්ථසාධක අරමුදල්හි පෞද්ගලික අංශයෙහි සේවක සංඛ්‍යාව 1990 වසර අවසානයේදී 82,778 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 44.6 ක වර්ධනයකි.

මහ කොළඹ ආර්ථික කොමිසමට (ම.කො.ආ.කො.) අයත් ආයතනවල සේවක සංඛ්‍යාව මෙම වසරේදී තවදුරටත් වර්ධනය විය. 1990 වසර අවසානයේදී ම.කො.ආ.කො. ට අයත් ආයතනවල, පුද්ගලයින් 71,585 ක් සේවයේ යෙදී සිටි අතර, එය 1989 වර්ෂයට වඩා සියයට 16.5 ක වර්ධනයකි. මෙම රැකියා අවස්ථාවන් සපයනු ලැබුවේ ව්‍යාපෘතීන් 120 ක් මගිනි. එම ව්‍යාපෘතීන් වලින් 65 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේම වූ අතර, ඉතිරි ඒවා බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ හා ම.කො.ආ.කො. ට අයත් බලප්‍රදේශයට පරිබාහිරව පිහිටා ඇත.

ස්වයං රැකියා හා දුගී බව තුරන් කිරීමේ වැඩපිළිවෙල තවදුරටත් පුළුල් කිරීමට රජය විසින් පියවර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ණය සැපයුම් ක්‍රම යටතේ ස්වයං රැකියා හා ආදයම් උපයා ගැනීමේ මාර්ග සඳහා ණය පහසුකම් සැලසිනි. මෙම වැඩපිළිවෙල යටතේ ණය ලබාගත් අයගෙන් සැලකිය යුතු පිරිසක් එම මුදල්, ආදයම් උපයා ගැනීමේ මාර්ග සඳහා යෙදවීමෙන් රැකියා උත්පාදනයට දයක වී ඇති බව මෑතදී කරන ලද අධ්‍යයන වලින් හෙළි විය. ඒ සමඟම 1990 වසරෙහි පැවති සතුටුදයක ආර්ථික ප්‍රගතියද, අළුත් රැකියා අවස්ථා රට තුළ බිහි වීමට මුල් වන්නට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් අනුමත කරන ලද විදේශ රැකියා ඇණවුම් ප්‍රමාණය 1990 දී කැපී පෙනෙන ලෙස සියයට 21.5 කින් ඉහළ ගොස් ඇත.